දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය - Faculty of Humanities & Social Sciences

ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) පරීක්ෂණය - 2020 (පුනර් 2016) - 2022 පෙබරවාරි / මාර්තු
First Examination in Arts (External) - 2020 (Repeat 2016) – February / March 2022

ඉප්‍ර 1.1 - ශ්‍රී ලංකාවේ ඉතිහාසය (ආරම්භයේ සිට ක්‍රි.ව 1500 දක්වා)
HY 1.1 – History of Sri Lanka (From the beginning to 1500 AD)

කාලය පැය (03) තුන යි.

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න. පැහැදිලි අත් අකුරින් පිළිතුරු සැපයිය යුතු ය.

---

01. මහසෙන් රාජ්‍ය සමය අවසානය තෙක් ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමෙහිලා මහාවංශයෙහි ඇති වැදගත්කම පරීක්ෂා කරන්න.

(ලකුණු 20)

02. "දේවානම්ප්‍රියතිස්ස රාජ්‍ය සමය දේශපාලන මෙන්ම සංස්කෘතික ක්ෂේත්‍රයේ ද අතිශයින්ම වැදගත් අවධියකි" විචාරාත්මකව විමසන්න.

(ලකුණු 20)

03. දිවයින එක්සත් කිරීමෙහිලා මාගම පාලකයන් වූ කාවන්තිස්ස, දුටු ගැමුණු නරපතීන්ගේ දායකත්වය විමසුමට ලක් කරන්න.

(ලකුණු 20)

04. ශ්‍රී ලාංකේය ඉතිහාසයේ ශ්‍රේෂ්ඨතම දායාදයන් රැසක් අනුරාධපුර යුගයේ දක්නට ලැබේ. ඒ අතුරින් පහත දැක්වෙන <u>**එක් ක්ෂේත්‍රයක් (01)**</u> ඇසුරෙන් ඓතිහාසික විස්තරයක් ලියන්න.

(i) වාරිමාර්ග පද්ධතිය
(ii) ගෘහ නිර්මාණ හා කලා නිර්මාණ
(iii) කෘෂිකර්මය හා වෙළඳාම

(ලකුණු 20)

05. පළමුවැනි පරාක්‍රමබාහු රජතුමාගේ කාර්ය සාඵල්‍යය පහත දැක්වෙන මාතෘකා <u>**දෙකක් (02)**</u> ඇසුරෙන් සාකච්ඡා කරන්න.

(i) දිවයින එක්සේසත් කිරීම
(ii) ආගමික සේවාව
(iii) වාරි කටයුතු හා ආර්ථික සංවර්ධනය
(iv) විදේශ සම්බන්ධතා

(ලකුණු 10x2 = 20)

06. රජරට ශිෂ්ඨාචාරයේ පරිහානිය හා බිඳවැටීමට තුඩු දුන් හේතු සාධක පැහැදිලි කරන්න.

(ලකුණු 20)

07. "දඹදෙනි යුගය මෙරට ඉතිහාසයේ කැපීපෙනෙන සංස්කෘතික ප්‍රබෝධයක් ඇතිවූ අවධියක් සේ සැලකේ" විමසන්න.

(ලකුණු 20)

08. කෝට්ටේ vi වන පරාක්‍රමබාහු රාජ්‍ය සමයේ ඇති වැදගත්කම විස්තර කරන්න.

(ලකුණු 20)

****************